# මහනුවර දළදා මාළිගයේ පත්තිරිප්පුව පිළිබඳ විමර්ශනයක්

එච්.ආර්.විනෝදි රසංගිකා[1]

ඓතිහාසික මහනුවර පුරවරයේ සුවිශේෂී ගෘහ නිර්මාණ අංගයක් ලෙස පත්තිරිප්පුව හැඳින්විය හැකිය. ලක්දිව අවසාන රජු වන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් එය ඉදිකරවා ඇත. පත්තිරිප්පු ගොඩනැගිල්ල සැලසුම් කරන ලද්දේ දේවේන්ද්‍ර මූලාචාරීන් විසිනි. පත්තිරිප්පුව 1811 දී නිමවා ඇති අතර මෙයට අවශ්‍ය දැව මාතලේට නුදුරු නාලාන්දේ කැලයෙන් කපන ලදි. පත්තිරිප්පුවේ අලංකාර සැලැස්ම සෑදීමට පෙර රබ කදන් ඉරා පතුරුවලින් සාදනු ලැබුවේ දෙදිගම දියවඩන නිලමේ විසිනි. මෙම මණ්ඩපය සෑදීමට නියෝග දුන් තැන දළදා මාලිගාවේ මුළුතැන්ගෙය තිබූ බැවින් රාජ සභාවේ හා ජනතාව අතර විරෝධතා මධ්‍යයේ මුළුතැන්ගෙය කඩා පත්තිරිප්පුව ඉදිකරන ලදි. දේවේන්ද්‍ර මූලාචාරීන්ගේ මෙම කටයුත්තට ඊර්ෂ්‍යා කළ පිරිස් ඉදිකිරීම සඳහා වූ දැව වල දිග අගල් 6 ක් අඩුකර එහි වරද මූලාචාරීන් මත පැවරිය. පත්තිරිප්පුව යන වදන තැනී ඇත්තේ පාර්තු-ඉරිප්පු යන දෙමළ වචන එකතු වීමෙනි. එහි අර්ථය වාඩි වී නරඹනවා යන්නයි. ලෝක උරුමයක් වන දළදා මාළිගයේ අංගයක් වන පත්තිරිප්පුව පිළිබඳ උඩරට රජවරුන්ගේ දායකත්වය කෙබඳුවේ ද? යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටළුව ලෙස අවධානය යොමු වේ. මහජනතාවට රජු දැකගත හැකි වූයේ සිහසුන අරා මගුල් මඩුවේ සිටින විට හෝ පත්තිරිප්පුවේ සිටින විට පමණි. රජු පත්තිරිප්පුවේ සිට කඩු සරඹ, මල්ලව පොර හා නැටුම් ද නැරඹූ අතර හදිසි අවස්ථාවක් වුවහොත් යුක්තියේ ඝණ්ටාරයක් නාද තළ අතර එම ශබ්දය ඇසූ රජතුමා වහා පත්තිරිප්පුවට පැමිණ හේතු කාරණා විමසා බලා යුක්තිය පසිඳලා ඇත. ජනතාවගේ හඬට සවන් දෙන අතීත රජවරුන් මෙන් වර්තමානයේ ද ක්‍රියාකාරී වීම වැදගත්කම වේ. අතීත රජවරුන් ජනතාව සමග මිත්‍රශීලී වූ ආකාරය මින් මනාව පැහැදිලි වේ. සාහිත්‍ය මූලාශ්‍රය පාදක කරගනිමින් රැස්කර ගන්නා ලද ගුණාත්මක දත්ත විග්‍රහ කරමින් මෙම පර්යේෂණය සිදුකර ඇත. පත්තිරිප්පුව ඉංග්‍රීසි පාලන සමයේ පෙරදිග පුස්තකාලයක්ව පැවතුනි. පත්තිරිප්පුවේ ගරාදිවැට පිත්තලෙන් ද, සිවිලිම දැකුම්කළු චිත්‍රවලින් ද, කොත්කැරැල්ල රන් ආලේපිතව පවතී. සිංහල රජ සමයේ දී දළදා මැදුරට පිවිස දළදා වහන්සේ වන්දනාමාන කිරීමට සාමාන්‍ය වැසියාට අවස්ථාව නොලැබුණු අතර දළදාව ප්‍රදර්ශනය කර ඇත්තේ පත්තිරිප්පුවේ සිටය. පහළ මළුවේ සිට ජනතාව දළදා වහන්සේ වන්දනාමානකර ඇත. වර්තමානයේ මෙම පත්තිරිප්පුවේ ඉහළ මාලය පුස්කොළ පොත් තැන්පත් කිරීමට යොදා ගෙන ඇති අතර පහත මාලය බෞද්ධ පොත්හලකි. අතීතයේ ජනතාව හා රජතුමා අතර පැවති සමීප බව ඉස්මතු කරන අභිමානවත් කලා නිර්මාණයක් ලෙස පත්තිරිප්පුව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : පත්තිරිප්පුව, දළදා මාලිගය, දේවේන්ද්‍ර මූලාචාරී, ගෘහ නිර්මාණ ශිල්පය

---

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.vinodirasangika19@gmail.com